# එකාදසමො පාඨො

තස්ස මය්හං රාජකුමාර; එතදහොසි කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං? කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතීති? තස්ස මය්හං; රාජකුමාර; එතදහොසි. බහුකාරා ඛො මෙ පඤ්චවග්ගියා භික්ඛූ යෙ මං පධානපහිතත්තං උපට්ඨහිංසු. යන්නූනාහං පඤ්චවග්ගියානං භික්ඛූනං පඨමං ධම්මං දෙසෙය්‍යන්ති. තස්ස මය්හං; රාජකුමාර, එතදහොසි; කහං නු ඛො එතරහි පඤ්චවග්ගියා භික්ඛූ විහරන්තීති. අද්දසං ඛ්වාහං; රාජකුමාර, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන පඤ්චවග්ගියෙ භික්ඛූ බාරාණසියං විහරන්තෙ ඉසිපතනෙ මිගදායෙ. අථ ඛ්වාහං, රාජකුමාර, උරුවෙලායං යථාභිරන්තං විහරිත්වා යෙන බාරාණසී තෙන චාරිකං පක්කමිං. අද්දසා ඛො මං; රාජකුමාර, උපකො ආජීවකො අන්තරා ච ගයං අන්තරා ච බොධිං අද්ධානමග්ගප්පටිපන්නං. දිස්වාන මං එතදවොච. විප්පසන්නානි ඛො තෙ; ආවුසො, ඉන්ද්‍රියානි, පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. කංසි ත්වං, ආවුසො, උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා? කස්ස වා ත්වං ධම්මං රොචෙසීති? එවං වුත්තෙ; අහං; රාජකුමාර, උපකං ආජීවකං ගාථාහි අජ්ඣභාසිං.

සබ්බාභිභූ සබ්බවිදූහමස්මි, සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො, සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං.

න මෙ ආචරියො අත්ථි, සදිසො මෙ න විජ්ජති
සදෙවකස්මිං ලොකස්මිං, නත්ථි මෙ පටිපුග්ගලො.

අහඤ්හි අරහා ලොකෙ, අහං සත්ථා අනුත්තරො
එකොම්හි සම්මාසම්බුද්ධො, සීතිභූතොස්මි නිබ්බුතො.

ධම්මචක්කං පවත්තෙතුං, ගච්ඡාමි කාසිනං පුරං
අන්ධභූතස්මිං ලොකස්මිං, ආහඤ්ඡං අමතදුන්දුභින්ති.

(බොධිරාජකුමාරසුත්ත - මජ්ඣිමනිකාය)

**පදමාලාව**

| | | | |
|---|---|---|---|
| **කස්ස** | (ස.නා) | - | කවරෙකුට |
| **දෙසෙය්‍යං** | (ක්‍රි) | - | දෙසන්නෙම් ද |
| **ඛිප්පං** | (නි) | - | වහා |
| **ආජානිස්සති** | (ක්‍රි) | - | දැනගන්නේ ය |
| **බහුකාරා** | (ස) | - | බොහෝ උපකාර වූවාහු |
| **පධානපහිතත්තං** | (ස) | - | ප්‍රධන් වීර්යය පිණිස මෙහෙය වූ සිත් ඇති |
| **උපට්ඨහිංසු** | (ක්‍රි) | - | උවටැන් කළහ |
| **කහං** | (නි) | - | කොහි |

| | | | |
|---|---|---|---|
| එතරහි | (නි) | - | දැන් |
| අද්දසං | (ක්‍රි) | - | දුටිමි |
| දිබ්බෙන චක්ඛුනා | (නා) | - | දිවැසින් |
| විසුද්ධෙන | (ස) | - | පිරිසිදු |
| අතික්කන්තමානුසකෙන | (ස) | - | මිනිස්බව ඉක්ම සිටි |
| අථඛ්වාහං | (සං) | - | ඉක්බිති  මම |
| යථාභිරන්තං | (නි) | - | කැමති තාක් |
| අන්තරා | (නි) | - | අතර දී |
| අද්ධානමග්ගං | (ස) | - | දීර්ඝ වූ මාර්ගය |
| දිස්වාන | (පූ.ක්‍රි) | - | දැක |
| විප්පසන්නානි | (කි) | - | බෙහෙවින් ප්‍රසන්නය |
| ඡවිවණ්ණො | (ස) | - | සමෙහි වර්ණය |
| කං | (නා) | - | කවරෙකු |
| සබ්බවිදූහමස්මි | (සං) | - | මම සියල්ල දන්නෙක් වෙමි |
| සබ්බාභිභූ | (ස) | - | සියලු ධර්ම මැඩගෙන (සිටිමි) |
| අනූපලිත්තො | (ස) | - | කෙලෙස් හා නොගැටුණේ (වෙමි) |
| සබ්බඤ්ජහො | (ස) | - | සියල්ල අත් හළේ |
| තණ්හක්ඛයෙ | (ස) | - | තෘෂ්ණාව නැති කිරීමෙහි |
| අභිඤ්ඤාය | (පූ.ක්‍රි) | - | වෙසෙසින් දැන |
| උද්දිසෙය්‍ය | (ක්‍රි) | - | උදෙසම් ද |
| අමතදුන්දුභිං | (ස) | - | අමාබෙර |
| ආහඤ්ඤං | (ක්‍රි) | - | වයන්නෙමි |

**අභ්‍යාස**

01. 'ආහඤ්ඤං අමතදුන්දුභිං' පාඨය සිංහලට නගන්න.

02. පාලි භාෂාවෙන් පිළිතුරු සපයන්න.

i. බුද්ධො කෙසානං පඨමං ධම්මං දෙසෙසි?
ii. කහං නු ඛො පඤ්චවග්ගියා භික්ඛූ විහරිංසු?
iii. උපකො ආජීවකො කිං අභාසි?
iv. කස්ස පටිපුග්ගලො නත්ථි?
v. බුද්ධො ධම්මචක්කං පවත්තෙතුං කිං නාම පුරං ගච්ඡි?

03. පාලියට නගන්න.

i. කවරෙක් මේ දහම වහා ම දැනගන්නේ ද?
ii. පස්වග මහණහු දැන් කොහි වෙසෙත් ද?
iii. පළමුව පස්වගමහණුන්ට ධර්මය දෙසන්නේ නම් මැනවි.
iv. ඔබ කවරකුගේ ධර්මය රුචි කෙරෙහි ද?
v. දම්සක් පැවැත්වීමට කාසි පුරයට යමි.

04. පිළිතුරු ලියන්න.

i. බුදුන් වහන්සේ පළමුව පස්වග මහණුන්ට දහම් දෙසන්නට සිතුවේ කුමක් නිසා ද?
ii. පළමු දහම් දේශනාවට යන අතරමඟ දී හමු වූ ආජීවකයා කවු ද?
iii. බුද්ධත්වය ලබා ගැනීමට හේතු වන කරුණු 03ක් ලියන්න.
iv. බුදුන් වහන්සේ පළමුව දේශනා කළ සූත්‍රය කුමක් ද?
v. මිනිසත් බව ඉක්ම සිටි දිවැස යනු කුමක් ද?

## තද්ධිත නාම

### හැඳින්වීම

නාමයන්ගේ අගට විශේෂ අර්ථ පැවසෙන තද්ධිත ප්‍රත්‍යය එක්කර සාදා ගන්නා ලද නාම තද්ධිත නාම නම් වේ. තද්ධිත පද සාධනයෙන් පහසුවෙන් උච්චාරණය කිරීමේ හැකියාව, ක්‍රමානුකූල බව, සංක්ෂිප්ත බව, ව්‍යක්ත බව හා අලංකාරවත් බව ඇති වේ.

### තද්ධිත පද සාධනය

- නාම පදයට පසුව තද්ධිත ප්‍රත්‍යය යෙදීම.
- නාම පදයේ විභක්ති ප්‍රත්‍යය ලොප් කිරීම. **(තෙසං විභත්තියො ලොපා ච)**
- සංයුක්ත නොවූ පදයන්හි ආදි ස්වරය වෘද්ධි කිරීම. **(වුද්ධාදිසරස්ස වා සංයොගන්තස්ස සණෙ ච)**
- සුදුසු පරිදි සන්ධි කාර්යය කොට පද සිද්ධ කිරීම.

### වෘද්ධි කිරීම

**''අයුවණ්ණානං චායො වුද්ධි''**

අ, ඉ, උ වර්ණ වෘද්ධි වේ. ඒ පහත සඳහන් පරිදි ය.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | > | ආ | > | සමණ | + | ණෙර | > සාමණෙර |
| ඉ ඊ | > | එ | > | විනතා | + | ණෙය්‍ය | > වෙනතෙය්‍ය |
| | | | | වීණා | + | ණික | > වෙණික |
| උ ඌ | > | ඔ | > | උළුම්ප | + | ණික | > ඔළුම්පික |

වෘද්ධිය කළ පසු එම 'ණ' කාරය ලොප් කිරීම. **(තෙසං ණො ලොපං)** වේ.

| | | | | |
|---|---|---|---|---|
| උදා :- | වසිට්ඨස්ස | + ණ - | තද්ධිත ප්‍රත්‍යය යෙදීම | - **වාණපච්චෙ** |
| | වසිට්ඨ | + ණ - | විභක්ති ලෝපය | - **තෙසං විභත්තියො ලොපා ච** |
| | වාසිට්ඨ | + ණ - | ආදි ස්වර වෘද්ධිය | - **අයුවණ්ණානං චායො වුද්ධි** |
| | වාසිට්ඨ | + අ - | ණකාර ලෝපය | - **තෙසං ණො ලොපං** |
| | වාසිට්ඨ් | + අ - | සන්ධි කාර්යය | - **සරා සරෙ ලොපං** |
| | වාසිට්ඨ | - | පද සාධනය | - **නයෙ පරං යුත්තෙ** |

**තද්ධිත ප්‍රභේද**

තද්ධිත ප්‍රධාන ප්‍රභේද 03 කි.

1. **සාමඤ්ඤ තද්ධිත නාම**
2. **භාව තද්ධිත නාම**
3. **අව්‍ය තද්ධිත නාම**

**සාමඤ්ඤ තද්ධිත නාම**

අපච්ච ආදි සාමාන්‍ය අර්ථ පැවසෙන තද්ධිත නාම සාමඤ්ඤ තද්ධිත නාම ගණයට අයත් වේ. සාමඤ්ඤ තද්ධිත නාම කොටස් 04 කට බෙදේ. මෙම බෙදීම් සිදු කර ඇත්තේ ප්‍රත්‍යයවල දක්නට ලැබෙන අර්ථ සැලකිල්ලට ගෙන ය.

1. **අපච්චත්ථ තද්ධිත නාම**
2. **අනෙකත්ථ තද්ධිත නාම**
3. **අත්ථ්‍යත්ථ තද්ධිත නාම**
4. **සංඛ්‍යා තද්ධිත නාම**

අර්ථ අනුව තද්ධිත 06 කි.

1. **අපච්චත්ථ තද්ධිත නාම**
2. **අනෙකත්ථ තද්ධිත නාම**
3. **අත්ථ්‍යත්ථ තද්ධිත නාම**
4. **සංඛ්‍යා තද්ධිත නාම**
5. **භාව තද්ධිත නාම**
6. **අව්‍යය තද්ධිත නාම**

**1. අපච්චත්ථ තද්ධිතය**

පුත්‍රාර්ථයක් ප්‍රකාශ කරණ ''ණ'' ආදි ප්‍රත්‍යය එක්වී සෑදෙන තද්ධිත නාම අපච්චත්ථ තද්ධිත නාම නම් වේ. අපච්චත්ථ තද්ධිතයෙන් දුව, පුතා, මිනිබිරී, මුණුබුරු ආදි දරු පරම්පරාව ප්‍රකාශ වේ. ජට්ඨී විභක්ත්‍යර්ථවත් නාමවලට පසුව අපච්චත්ථ තද්ධිත ප්‍රත්‍යය යෙදේ.

**අපච්චත්ථ තද්ධිත ප්‍රත්‍යය**

''**ණ, ණායන, ණාන, ණෙය්‍ය, ණි, ණික, ණව, ණෙර, ණ්‍ය**'' යනුවෙනි.

''**ණ**'' ප්‍රත්‍යය - ''**වාණපච්චෙ**'' ෂට්ඨී විභක්ත්‍යන්ත නාමයන් කෙරෙන් පුත්‍රාර්ථයේ 'ණ' යන ප්‍රත්‍යය යෙදේ.

උදා :- වසිට්ඨස්සස අපච්චං වසිට්ඨ + ණ > වාසිට්ඨ - (වසිට්ඨගේ පුතු)
වසුදෙවස්සස අපච්චං වසුදෙව + ණ > වාසුදෙව - (වසුදෙවගේ පුතු)

''**ණායන, ණාන**'' **ප්‍රත්‍යය** - ''**ණායනණානා වච්ඡාදිතො**'' වච්ඡාදි ශබ්දවලින් පසු 'ණායන, ණාන' යන ප්‍රත්‍යය යෙදේ

උදා :- වච්ඡස්සස අපච්චං > වච්ඡ + ණායන - වච්ඡායන (වත්සගේ පුතා)
කච්චස්සස අපච්චං > කච්ච + ණායන - කච්චායන (කච්චගේ පුතා)
වච්ඡස්සස අපච්චං > වච්ඡ + ණාන - වච්ඡාන (වත්සගේ පුතා)
කච්චස්සස අපච්චං > කච්ච + ණාන - කච්චාන (කච්චගේ පුතා)

''**ණෙය්‍ය**'' ප්‍රත්‍යය - ''**ණෙය්‍යො කත්තිකාදීහි**'' කත්තිකාදි ශබ්දවලින් පසුව පුත්‍රාර්ථයෙහි 'ණෙය්‍ය' යන ප්‍රත්‍යය යෙදේ.

උදා :- කත්තිකාය අපච්චං > කත්තික + ණෙය්‍ය - කත්තිකෙය්‍ය (කාර්තිකාගේ පුතු)
විනතාය අපච්චං > විනතා + ණෙය්‍ය - වෙනතෙය්‍ය (විනතාගේ පුතු)

''**ණි, ණික**'' ප්‍රත්‍යය - ''**අතො ණි වා**'' අකාරාන්ත නාමවලින් පසුව පුත්‍රාර්ථයේ 'ණි' ප්‍රත්‍යය යෙදේ. වා නිපාතයේ බලයෙන් 'ණික' ප්‍රත්‍යය ද යෙදේ.

උදා :- දක්ඛස්සස අපච්චං > දක්ඛ + ණි - දක්ඛි (දක්ඛයාගේ පුතු)
සක්‍යපුත්තස්සස අපච්චං > සක්‍යපුත්ත + ණික - සක්‍යපුත්තික (සාක්‍ය පුත්තගේ පුතු)

''**ණව**'' ප්‍රත්‍යය - ''**ණවො'පගවාදීහි**'' උපගු ආදි ශබ්දවලින් පසුව පුත්‍රාර්ථයෙහි 'ණව' ප්‍රත්‍යය යෙදේ.

උදා :- මනුනො අපච්චං > මනු + ණව - මානව - (මනුහුගේ පුතු)
උපගුනො අපච්චං > උපගු + ණව - ඔපගව - (උපගුගේ පුතු)

''**ණෙර**'' ප්‍රත්‍යය - ''**ණෙර විධවාදිතො**'' විධවා ආදි ශබ්දවලින් පසුව පුත්‍රාර්ථයේ 'ණෙර' ප්‍රත්‍යය යෙදේ.

උදා :- විධවාය අපච්චං > විධවා + ණෙර - වෙධවෙර (විධවාගේ පුතු)
සමණස්සස අපච්චං > සමණ + ණෙර - සාමණෙර (ශ්‍රමණහුගේ පුතු)

''ණ්‍ය'' ප්‍රත්‍යය - ''ණ්‍ය කුරු සිවීහි'' කුරු ආදි ශබ්දවලින් පසුව 'ණ්‍ය' ප්‍රත්‍යය යෙදේ.

උදා :- කුරුනො අපච්චං > කුරු + ණ්‍ය - කොරව්‍ය (කුරු පරපුරට අයත්)

ණො ණායනො ච ණානො ච
ණෙයියො ණි ච ණිකො තථා
ණවො ණෙරො ච ණ්‍යො චාති
නව ගොත්ත පතිට්ඨිතා.

## 2. අනේකාර්ථ තද්ධිත නාම

ඇතැම් තද්ධිත ප්‍රත්‍යයවල බොහෝ අර්ථ ඇත. එහෙයින් ඒවා අනේකාර්ථ තද්ධිත ප්‍රත්‍යය නම් වේ. විවිධ අර්ථවල මෙම ප්‍රත්‍යය යෙදී තද්ධිත නාම සෑදේ.

**අනේකාර්ථ තද්ධිත ප්‍රත්‍යය.**

**ණික, ණ, ඉම. ඉය, ඊය, එය්‍යක, ණක**

**''ණික ප්‍රත්‍යය''** - **''යෙන වා සංසට්ඨං තරති චරති වහති ණිකො''**
**''තමධීතෙ තෙන කථා සන්නිධාන නියොග සිප්පභණ්ඩ ජීවිකත්‍ථෙසුච''**

යන බාලාවතාර සූත්‍රවලින් 'ණික' ප්‍රත්‍යය යෙදෙන අර්ථ කියැවේ. ඒවා පහත දැක්වේ.

**යෙන වා සංසට්ඨං** - යමකින් මිශ්‍ර වූයේ ය යන අර්ථයෙහි

| | | | | | |
|---|---|---|---|---|---|
| සත | + | ණික | > | සාතික | (ගිතෙලින් මිශ්‍ර වූ දෙය) |
| තිල | + | ණික | > | තෙලික | (තෙලින් මිශ්‍ර වූ දෙය) |

**යෙන වා තරති** - යමකින් එතර වූයේ ය යන අර්ථයෙහි

| | | | | | |
|---|---|---|---|---|---|
| නාවා | + | ණික | > | නාවික | (නැවින් එතෙර වූයේ) |
| උළුම්ප | + | ණික | > | ඔළුම්පික | (පහුරෙන් එතෙර වූයේ) |

**යෙන වා චරති** - යමකින් හැසිරේ ය යන අර්ථයෙහි

| | | | | | |
|---|---|---|---|---|---|
| සකට | + | ණික | > | සාකටික | (කරත්තයෙන් හැසිරෙන) |
| ධම්ම | + | ණික | > | ධම්මික | (ධර්මයෙහි හැසිරෙන) |

**යෙන වා වහති** - එයින් උසුලයි යන අර්ථයෙහි

| | | | | | |
|---|---|---|---|---|---|
| සීස | + | ණික | > | සීසික | (හිසින් උසුලන්නා) |
| හත්‍ථ | + | ණික | > | හත්‍ථික | (අතින් උසුලන්නා) |

**තං අධීතෙ -** එය හදාරයි යන අර්ථයෙහි

| | | | | | |
|---|---|---|---|---|---|
| විනය | + | ණික | > | වෙනයික | (විනය හදාරන්නා) |
| අභිධම්ම | + | ණික | > | ආභිධම්මික | (අභිධර්මය හදාරන්නා) |

**තෙන කතං -** එයින් කරන ලද්දේ ය යන අර්ථයෙහි

| | | | | | |
|---|---|---|---|---|---|
| කාය | + | ණික | > | කායික | (කයින් කරන ලද) |
| මනස | + | ණික | > | මානසික | (මනසින් කරන ලද) |

**තස්මිං නියුත්තො -** එහි නියුක්ත වූයේ යන අර්ථයෙහි

| | | | | | |
|---|---|---|---|---|---|
| ද්වාර | + | ණික | > | දොවාරික | (දොරෙහි නියුක්ත වූ) |

**අස්ස සිප්පං -** ඔහුගේ ශිල්පය යන අර්ථයෙහි

| | | | | | |
|---|---|---|---|---|---|
| වීණා | + | ණික | > | වෙණික | (වීණා වාදනය ඔහුගේ ශිල්පය යි) |

**අස්ස භණ්ඩං -** ඔහුගේ භාණ්ඩ යන අර්ථයෙහි

| | | | | | |
|---|---|---|---|---|---|
| තණ්ඩුල | + | ණික | > | තණ්ඩුලික | (සහල් බඩු ඇත්තා) |

**තෙන ජීවිකත්ථෙ -** එයින් ජීවත් වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගව | + | ණික | > | මාගවික | (මුවන් මරා ජීවත් වන්නා) |

ප්‍රත්‍යය - ''**ණ, රාග තෙන රත්තං තස්සෙදමඤ්ඤත්ථෙසු ච**'' යන සූත්‍රයෙන් 'ණ' ප්‍රත්‍යය පහත සඳහන් අර්ථවල යෙදෙන බව කියවේ.

**තෙන රත්තං -** එයින් පැහැගැන්වුණු යන අර්ථයෙහි

| | | | | | |
|---|---|---|---|---|---|
| කසාව | + | ණ | > | කාසාව | (කහ පැහැ ගැන්වූ) |

**තස්ස ඉදං -** මෙය මොහුගේ ය යන අර්ථයෙහි

| | | | | | |
|---|---|---|---|---|---|
| මහිස | + | ණ | > | මාහිස | (මීමාගේ අඟ) |

**ඉම, ඉය** ප්‍රත්‍යය-''**ජාතාදීනමිමියා ච**'' එයින් උපන්නේ ය යන අර්ථයෙහි 'ඉම, ඉය' ප්‍රත්‍යය යෙදේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| **ඉම** ප්‍රත්‍යය - | පච්ඡ | + ඉම | > | පච්ඡිම | (පසුව වූයේ ය) |
| **ඉය** ප්‍රත්‍යය - | මනුස්ස ජාති | + ඉය | > | මනුස්ස ජාතියා | (මිනිස් බවේ උපන්) |
| | කප්ප | + ඉය | > | කප්පිය | (මොහුට කැප ය) |

ඊය ප්‍රත්‍යය ''**තදසසසටඨානමීයො ච**'' එය එයට කරුණු ය යන අර්ථයෙහි 'ඊය' ප්‍රත්‍යය යෙදේ.

| | | | |
|---|---|---|---|
| බන්ධ | + ඊය | > බන්ධනීය | (බැම්මට කරුණු ය) |
| පසාදන | + ඊය | > පසාදනීය | (පැහැදීමට කරුණු) |

**එය්‍ය, ණික** ප්‍රත්‍යය -''**ඉත්ථිලිංගතො එය්‍යකො ණිකො ච**'' ස්ත්‍රිලිංග ශබ්දයන්ගෙන් පසුව එහි උපන් යන අර්ථයෙහි 'එය්‍යක' හා 'ණික' ප්‍රත්‍යය යෙදේ.

| | | | |
|---|---|---|---|
| චම්පා | + එය්‍යක | > චම්පෙය්‍යක | (චම්පාවෙහි උපන්) |
| කුසිනාරා | + ණික | > කොසිනාරක | (කුසිනාරාවේ උපන්) |

★ මෙසේ ප්‍රත්‍යය එක්වී නොයෙක් අර්ථ නිපදවෙන පද අනේකත්‍ථ තද්ධිතයට අයත් වේ.

**අභ්‍යාස**

01. තද්ධිත පද භාවිත කරමින් පාලියට නගන්න.

i. ඒ මානවකයා වහා ධර්මය අවබෝධ කර ගනී.
ii. මේ දොරටුපාලකයා මා රජු බව දනත් මහහඬින් සිනාසෙයි.
iii. තෙරුන් වහන්සේ මානසික සුව විඳින සේක.
iv. ගැල් පදවන්නා කරත්තයෙන් ගොස් බඩු විකුණයි.
v. කුසිනාරාවෙහි උපන් මිනිස්සු පින්වත් වූහ.

02. පහත වගුව සම්පූර්ණ කරන්න.

| නාමය | අර්ථය | තද්ධිත පදය |
|---|---|---|
| උදාඃ කත්තික | කාර්තිකාවගේ පුතු | කත්තිකෙය්‍ය |
| සමණ | ශ්‍රමණහුගේ පුතු | |
| ධම්ම | ධර්මයෙහි හැසිරෙන්නා | |
| මනුස්සජාති | මිනිස් බවේ උපන් | |
| මහිස | මීමාගේ අඟ | |
| කසාව | කහ පැහැ ගැන්වූ | |
| මනු | මනුහුගේ පුත් | |
| තිල | තෙලෙන් මිශ්‍ර වූ දෙය | |
| තණ්ඩුල | සහල් බඩු ඇත්තා | |
| උළුම්ප | පහුරෙන් එතර වූයේ | |
| උපගු | උපගුගේ පුතු | |

03. පහත සඳහන් තද්ධිත පද සෑදුණු ආකාරය පියවරෙන් පියවර දක්වන්න.

i. වාසිට්ඨ ii. වච්ඡායන iii. සාමණේර iv. ඔපගව v. ආභිධම්මික

04. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| තද්ධිත පදය | ප්‍රකෘති ප්‍රත්‍යය වෙන් කිරීම | අර්ථය |
|---|---|---|
| උදා: වාසුදෙව | වසුදෙව + ණ | වසුදේවගේ පුතු |
| සාකටික | | |
| මානසික | | |
| වෙණික | | |
| ඔළුම්පික | | |
| වෙනතෙය්‍ය | | |
| කොසිනාරක | | |
| ආභිධම්මික | | |
| මොග්ගල්ලායන | | |
| නාවික | | |
| පච්ඡිම | | |

05. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| තද්ධිත පදය | සිදුව ඇති වෘද්ධිය |
|---|---|
| උදා : සාකටික | අ > ආ වෘද්ධි වීම |
| කොසිනාරක | |
| මානව | |
| වෙනතෙය්‍ය | |
| ඔලුම්පික | |
| වෙණික | |